# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2365/65 - 2024 ජනවාරි මස 04 වැනි බ්‍රහස්පතින්දා - 2024.01.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57(1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පැවරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57(1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව, අංක 2248/10 හා 2021.10.04 දිනැති, අංක 2131/60 හා 2019.07.13 දිනැති, අංක 2074/45 හා 2018.06.08 දිනැති සහ අංක 2043/13 හා 2017.10.30 දිනැති *අති විශෙෂ ගැසට් නිවේදන* මගින් සංශෝධනය කරන ලද, අංක 2014/3 හා 2017.04.11 දිනැති *අති විශෙෂ ගැසට් නිවේදනයේ* සඳහන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද බලතල පැවරීමට පහත සඳහන් බලතල පැවරීම් ද ඇතුළත් කර සංශෝධනය කරනු ලැබේ. මෙම සංශෝධනය 2024.01.02 දින සිට බලාත්මක වේ.

"අ" උපලේඛනය

| *1 තීරුව*<br>නිලධාරී ගණය | *11 තීරුව*<br>බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන් | *111 තීරුව*<br>පවරන ලද බලතල |
|---|---|---|
| 1. අධිසේවක පදනම මත බඳවා ගන්නා ලද ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් | අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ ස්ථාන මාරු පටිපාටිය අනුව වාර්ෂික ස්ථාන මාරු කිරීම හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 268 අනුව සිදුකරන ස්ථාන මාරු කිරීම (අධිසේවක පදනම මත පත්කරනු ලැබ ඇති විදුහල්පතිවරුන් දරන තනතුරු අතරේ පමණි) |
| | අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් / අමාත්‍යාංශ ලේකම් විසින් නම් කරනු ලැබ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අතිරේක ලේකම්වරයකු | I. ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ දෙවැනි උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය. |


1A - G 41194 — 07 (2024/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

"අ" උපලේඛනය *(සම්බන්ධිතයි)*

| *1 තීරුව*<br>නිලධාරී ගණය | *11 තීරුව*<br>බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන් | *111 තීරුව*<br>පවරන ලද බලතල |
|---|---|---|
| 2. අධිසේවක පදනම මත බඳවා ගන්නා ලද ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I ශ්‍රේණියට පහළ ශ්‍රේණිවල නිලධාරීන් | අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාව අනුව උසස් කිරීම.<br><br>II. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 258 හා 263 අනුව සිදුකරන ස්ථාන මාරු කිරීම (අධිසේවක පදනම මත පත්කරනු ලැබ ඇති විදුහල්පතිවරුන් දරන තනතුරු අතරේ පමණි).<br><br>III. ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ පළමු උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය හා සේවයෙන් පහ කිරීම. |
| | අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් / අමාත්‍යාංශ ලේකම් විසින් නම් කරනු ලැබ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අතිරේක ලේකම්වරයකු | I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත ස්ථාන මාරු පටිපාටිය අනුව සිදුකරන වාර්ෂික ස්ථාන මාරු සහ රාජ්‍ය සේවා කොමිෂන් සභා පටිපාටික රීති 268 අනුව ස්ථාන මාරු කිරීම් (අධිසේවක පදනම මත පත්කරනු ලැබ ඇති විදුහල්පතිවරුන් දරන තනතුරු අතරේ පමණි).<br><br>II. ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ දෙවැනි උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය. |

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 56(1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පැවරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 56(1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව, අධ්‍යාපන සේවා කමිටුව වෙත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පවරන ලද අංක 2248/10 හා 2021.10.04 දිනැති *අති විශෙෂ ගැසට් නිවේදනය* මගින් සංශෝධනය කරන ලද, අංක 2014/3 හා 2017.04.11 දිනැති *අති විශෙෂ ගැසට් නිවේදනයෙහි* සඳහන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද බලතල පැවරීම පහත සඳහන් බලතල පැවරීම් ද ඇතුළත් කර සංශෝධනය කරනු ලැබේ. මෙම සංශෝධනය 2024.01.02 දින සිට බලාත්මක වේ.

"ආ" උපලේඛනය

| *1 තීරුව*<br>නිලධාරී ගණය | *111 තීරුව*<br>පවරන ලද බලතල |
|---|---|
| 1. අධිසේවක පදනම මත බඳවා ගන්නා ලද ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I ශ්‍රේණියේ නිලධරයන් | I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාව අනුව I ශ්‍රේණියට උසස් කිරීම.<br><br>II. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 258 හා 263 අනුව සිදුකරන ස්ථාන මාරු කිරීම් (අධිසේවක පදනම මත පත්කරනු ලැබ ඇති විදුහල්පතිවරුන් දරන තනතුරු අතරේ පමණි).<br><br>III. ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ පළමු උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය හා සේවයෙන් පහ කිරීම. |

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

**ඩබ්ලිව්. එච්. එම්. එම්. සී. කේ. දයාරත්න,**
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2024 ජනවාරි මස 02 වැනි දින,
අංක 1200/9,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

EOG 01 - 0045

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.